කාර්ය පත්‍රිකාව **5.1**

# වීජීය ප්‍රකාශන




1) පහත දී ඇති ප්‍රකාශන තුල අඥාත අවස්ථා හඳුනාගෙන යටින් ඉරක් අඳින්න.

උදා= මම අඹගෙඩි 3ක් ඇහිඳ ගතිමි. මල්ලී ද <u>අඹ ගෙඩි කිහිපයක්</u> ඇහිඳ ගෙන තිබුනි.

- මා සමග හතර දෙනෙක් බසයට නැගුනි. ඒ වන විට මගීන් කිහිප දෙනෙකු බසයේ විය.
- කණ්ඩායමට අයත් වූ හතලිස් දෙනාගෙන් කිහිප දෙනෙකු ගැහැණු ළමුන් විය.
- ගණිත ක්‍රියාකාරකමට මම ඔලිද ඇට 15 ක් රැගෙන පැමිණියෙමි. සරත් ද ඔලිද ඇට කිහිපයක්_රැගෙන විත් තිබුනි.
- මා ළග තිබූ ලීයේ දිග $3m$ විය. එහෙත් සරත් ළග තිබූ ලීයේ දිග හෝ නිමල් ළග තිබූ ලීයේ දිග මා දැන සිටියේ නැත.
- බෝධි පූජාවට මා පොල්තෙල් $200\ ml$ ක් රැගෙන පැමිණියෙමි. සඳුන් රැගෙන පැමිණි ප්‍රමාණයත් කමල් රැගෙන පැමිණි ප්‍රමාණයත් මලිත් රැගෙන පැමිණි ප්‍රමාණයත් එක් කල විට බෝතලය පිරී යනු ඇතැයි මට සිතුනි.
- මල්ලි ලග රුපියල් 20 ක් හා මා ලග රුපියල් 30 ක් ඇත.

2) අඥාත අවස්ථා ඇතුලත් ප්‍රකාශන 5 ක් ලියන්න.



කාර්ය පත්‍රිකාව 5.2

# වීජීය ප්‍රකාශන




1) දී ඇති නිදසුන අධ්‍යයනය කර පහත ප්‍රකාශන වරහන් සහිතව ලියන්න.

උදා= $2 \times x + 2 \times y = 2\,(x + y)$

| | |
|---|---|
| • $2 \times a + 2 \times b$ | |
| • $x \times 3 + y \times 3$ | |
| • $a \times 2 + b \times 2 + c \times 2$ | |
| • $6 \times x - 6 \times y$ | |
| • $2 \times 3 \times x + 5 \times 3 \times y$ | |
| • $4 \times 5 \times a - 3 \times 5 \times b + 5 \times 7 \times c$ | |
| • $12x + 6y$ | |
| • $a + b - c$ | |
| • $x \times y + x \times a - x \times c$ | |
| • $2x + 2y - 2a$ | |

2) වීජීය ප්‍රකාශන ගොඩනගන්න.

උදා= මා ළඟ රුපියල් $x$ ඇත. මල්ලි ළඟ රුපියල් $y$ ඇත. ගමන සඳහා අප දෙදෙනා සතු මුදල මෙන් තුන්ගුණයක් අවශ්‍ය වේ.

මා ළඟ ඇති මුදල = රුපියල් $x$

මල්ලි ළඟ ඇති මුදල = රුපියල් $y$

දෙදෙනා ළඟ ඇති මුදල = රුපියල් $x + y$

ගමනට අවශ්‍ය මුදල = රුපියල් $3(x + y)$

රාධා ඉටිපන්දම් $a$ ප්‍රමාණයක් ද කමලා ඉටිපන්දම් $b$ ප්‍රමාණයක් ද සමන් ඉටිපන්දම් 4 ක් ද රැගෙන පැමිණි මුත් එම ඉටිපන්දම් ප්‍රමාණය මෙන් දෙගුණයක් අවශ්‍ය විය. එම ප්‍රමාණය වීජීය ප්‍රකාශනයක් ලෙස ලියන්න.

3) සජාතීය පද තෝරා ලියන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| i. | $x, 3x, y$ | සජාතීය | විජාතීය | ii. | $xy, 2xy, 2b$ | සජාතීය | විජාතීය |
| iii. | $x, a, b$ | සජාතීය | විජාතීය | iv. | $x^2, 3x, x$ | සජාතීය | විජාතීය |
| v. | $2x, 5x, 5y$ | සජාතීය | විජාතීය | vi. | $8a, 8y, 8b$ | සජාතීය | විජාතීය |
| vii. | $2x^2, 3x^2, 2y$ | සජාතීය | විජාතීය | viii. | $3d, -3d, d, a$ | සජාතීය | විජාතීය |
| ix. | $(-2a), (-3a), a$ | සජාතීය | විජාතීය | x. | $4, 4x, 4y$ | සජාතීය | විජාතීය |